යම් පුවතකට අදාළ නොවන අවස්ථාවන් හිදී පුද්ගලයන්ගේ වාර්ගිකත්වයන් හෝ ආගමිකත්වයන් සඳහන් නොකළ යුතු බව දෙස් විදෙස් මාධ්‍ය ආචාර ධර්ම තුළ සඳහන් වේ. ඊට හේතුව, එසේ සෘණාත්මක සන්දර්භයන් තුළ වාර්ගිකත්වයන් හෝ ආගමිකත්වයන් පිළිබඳව හුවා දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වයන් හෝ ආගමිකත්වයන් ද සෘණාත්මකව ඒකාකෘතික වීමට හැකියාවක් තිබීමයි.

එම මාධ්‍ය ආචාර ධර්මය පසුතල කොට ගනිමින්, "රූපවාහිනියට බලෙන් පැන්න දානිෂ් රටින් පනිද්දී ප්ලේන් එකේදී කොටු වෙයි" යන සිරස්තලය සමගින් දිනමිණ පුවත්පතේ (ජූලි 27, 2022) පළවී ඇති පුවත් වාර්තාව පිළිබඳව විමසා බැලිය හැක. "මොහුගේ පියා දෙමළ ජාතිකයකු වන අතර, 1980 වසරේ විවාහයෙන් පසු මුස්ලිම් ආගම වැළඳගත්තෙකි, ඔහු මාවතගම පරගහදෙනිය ප්‍රදේශයේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ට තර්ජනය වන පවුලක් බවට පොලිසිය හඳුනාගෙන ඇති අන්තවාදී අදහස් දරන්නෙකි" යනුවෙන් මෙම පුවත් වාර්තාවේ සඳහන් වේ.

ඔබ සිතන ආකාරයට,

1) මෙම පුවතට සම්බන්ධ දානිෂ් ගේ හෝ ඔහුගේ පියාගේ වාර්ගිකත්වය/ආගමිකත්වය, මෙම පුවතට අදාළ වන්නේ කෙසේද?

2) එම වාර්ගිකත්වය සහ ආගමිකත්වය සඳහන් කිරීම සමගින්, ඔහු "අන්තවාදී අදහස් දරන්නෙකු" බවටද දිනමිණ ප්‍රකාශ කරන්නේ මන්ද? ඒ සඳහා පදනමක් තිබේද?

අදාළ නොවන තැන වාර්ගිකත්වයන් සහ ආගමිකත්වයන් සෘණාත්මකව ඉස්මතු නොකරමු!